# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම
## (සංස්ථාගත කිරීමේ)

**රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කුමාර වෙල්ගම මහතා විසින්
2022 අගෝස්තු මස 12 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ජූලි මස 25 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[133 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 24.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම
# (සංස්ථාගත කිරීමේ)

## රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව**

‘‘රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම’’ යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී පදනමට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී භාරකාරත්වය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය**

**1.** මේ පනත 2022 අංක      දරන රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම**

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු ‘‘පදනම’’ යනුවෙන් සඳහන් කරනු ලබන) රයිගම් ප්‍රජා සංවර්ධන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකිය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතුය.

**3.** (1) සංස්ථාපිත මණ්ඩලය පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

(අ) ගෘහ කර්මාන්ත සහ ස්වයං රැකියා නියුක්තිය සඳහා යෝජනා ක්‍රම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම;

(ආ) මාර්ග සංවර්ධන සහ නිවාස යෝජනා ක්‍රම, ආරෝග්‍යශාලා, ප්‍රජා මධ්‍යස්ථාන ඉදිකිරීම වැනි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම;

(ඇ) ළමයින්ගේ, කාන්තාවන්ගේ සහ අනාථ දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ගෘහ සුභසාධක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම, වීදි දරුවන් රැකබලා ගැනීම;

(ඈ) ස්වයං රැකියා සඳහා තරුණ තරුණියන් දිරිගන්වා ඒ සඳහා පුහුණුව ලබාදීම ණය පහසුකම් සලසා දීම, වෙළෙඳපොළ සොයා දීම;

(ඉ) ග්‍රාමීය හා නොදියුණු ප්‍රදේශ ඒවායේ ඇති ස්වාභාවික සම්පත් උපයෝගී කර ගනිමින් තිරසර දියුණුවක් ඇති කිරීම;

(ඊ) ඉහල ප්‍රතිලාභ ගැනීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම සොයා ගනිමින් කෘෂිකර්මාන්තය, වැවිලි හා ධීවර අංශය වැඩි දියුණු කිරීම;

(උ) විද්‍යා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සහ රටේ සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ප්‍රදේශ තුළ පිහිටුවීම;

(ඌ) රජයේ සංවර්ධන වැඩසටහන් කඩිනමින් ඉටු කරගැනීම සඳහා නාස්තිය වළකාලමින් ජනතාව වෙත වැඩි ප්‍රතිලාභ ලැබෙන අන්දමින් රජයේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට සහාය වීම;

(එ) මානුෂික ක්‍රීඩා, සාහිත්‍ය, සෞන්දර්යය හා අධ්‍යාත්මික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම හා උනන්දු කරවීම;

(ඒ) ජාති, ආගම් කුල භේදයෙන් තොරව අධ්‍යාපනික, ආගමික, කලා හා ක්‍රීඩා පහසුකම් දියුණු කිරීම සඳහා ආධාර උපකාර කිරීම සහ විවිධ උත්සව හා තරග පැවැත්වීම;

(ඔ) දුප්පත් අයට සහ රෝගී වූ අයට වෛද්‍ය සහන සහ ආධාර සැපයීම, මහලු අය සහ අවතැන් වූ අය වෙනුවෙන් නිවාස පිහිටුවීම හා ඒවා පවත්වාගෙන යාම, ළමා නිවාස පිහිටුවීම මෙන්ම ළමා හා වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම;

(ඕ) ඉහත දැක්වෙන පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී ජාතිය ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය, හෝ වෙනයම් හේතුවක් මත පදනම් කරගත් වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාපිත මණ්ඩලය වගබලා ගත යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**4.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු ම මුදල්, කමිටුව විසින් අනුමත කරන ලද එක් බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මෙම අරමුදලින්-

(අ) පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය කටයුතු කිරීම සහ සේවා ඉටු කිරීමෙහි ලා යම් වැය ශීර්ෂයන් යටතේ වියදම් කළ යුතු මුදල්;

(ආ) පදනමේ සේවක පිරිස සඳහා දීමනා;

(ඇ) නිලධාරීන් සහ අනෙකුත් ස්වේච්ඡා සේවකයින් විසින් පදනමේ යම් යම් කටයුතු සඳහා කරන වියදම්;

(ඈ) තැපැල් ගාස්තු, විදුලි පණිවිඩ, දුරකථන ඇමතුම්, ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ කටයුතු සඳහා කරන ගෙවීම්;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය මගින් වෙන් කොට ඇති මුදලින් පුණ්‍යාධාර සඳහා කරන ගෙවීම්;

(ඊ) විගණනය සඳහා වූ ගාස්තු;

(උ) කාර්යාලයීය සහ බඩු බාහිරාදිය මිලට ගැනීම සඳහා අවශ්‍ය මුදල් ගෙවනු ලැබිය යුතු ය. තව ද, පදනමේ පාවිච්චිය සඳහා වාහනයක් හෝ වාහන කිහිපයක් අවශ්‍යතාවයන් පරිදි මිලට ගැනීමට හෝ කුලී පදනම මත ලබා ගැනීමට ගෙවීම් කළ යුතු වේ;

(ඌ) පදනමේ බැංකු ගිණුම් පදනමේ නිලධාරීන් දෙදෙනකු විසින් පවත්වාගෙන යා යුතු ය. එනම් භාණ්ඩාගාරිකවරයා සහ සභාපතිවරයා විසින් විය යුතු අතර, චෙක්පත් අත්සන් කිරීමේ බලය ද ඔවුන් දෙදෙනා සතු විය යුතු ය.

ගිණුම් සහ විගණනය

**5.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම හා බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන්

වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරි ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද, එවැනි වරලත් ගණකාධිකාරි ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව

**6.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, එම දේපළ විකිණීමේ, උකස් කිරීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මණ්ඩලයේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ උප කමිටු පත් කිරීම

**7.** අවශ්‍ය සෑම අවස්ථාවකදී ම පහත සඳහන් කාර්ය සඳහා උපකමිටු පත් කිරීමට සභාපතිවරයාට හා අධ්‍යක්ෂක මණ්ඩලයට බලය තිබිය යුතු ය-

(අ) ශ්‍රමදාන, කඳවුරු, අධ්‍යාපනික සම්මන්ත්‍රණ, ඉතිරි කිරීමේ හා ණය ගනුදෙනු, පොදු වෙළෙඳසැල්, ප්‍රදර්ශන, ළමා සුභසාධන කටයුතු, අධ්‍යාපන ගමන්, පැල සිටුවීමේ ව්‍යාපාර, ගෙවතු වගා ව්‍යාපෘති සහ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති වැනි කාර්ය;

(ආ) සාමාජිකයකු විසින් කරන ලදැයි චෝදනා නගන ලද වැරදි හැසිරීම් හෝ ධුර දරන්නකු පදනම අයථා ලෙස පරිහරණය කළේ යැයි පැමිණිලි ඇති වූ විට හෝ ඒවා විභාග කිරීම;

(ඇ) පදනමේ පරමාර්ථවලට අනුකූලව වෙනත් යම් කාර්යයන්;

(ඈ) උප කමිටුවකට අඩුම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් ඇතුළත් තුන් දෙනෙකු හෝ ඇතුළත් විය යුතු අතර, සෙසු අය සාමාජිකයන් අතරින් පත් කරනු ලැබිය හැක;

(ඉ) අවශ්‍ය විටක යම් කමිටුවක් විසුරුවා ඒ වෙනුවට අලුත් උපකමිටුවක් පත් කිරීමට සභාපතිවරයාට හා අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත්තේ ය;

(ඊ) තව ද, පදනම පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ හෝ දිස්ත්‍රික්කයේ වෙනත් සාමාජිකයන් වෙත පදනමේ සේවය ලබා දීම සඳහා නියෝජිතයකු පත්කර, ක්‍රියාකාරී කමිටුවක් පත් කර ගත හැක.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

8. (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, සංස්ථාපිත මණ්ඩලයේ යම් මහාසභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කරුණු හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල විය යුතු යඃ-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) සභාවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත්වීම, බලතල, කාර්ය, සහ කර්තව්‍ය සහ කොන්දේසි නියමයන්;

(ඈ) මණ්ඩලයේ හෝ එහි යම් අනු කමිටුවක රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය, රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ සහ මණ්ඩලයේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) පොදුවේ සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කරගැනීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්ම එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම කල්හි ම සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීති *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල.

**9**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා හා කාරණා කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ බලය සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු යः-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලදී ගැනීම, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීමට සහ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසු යැයි සැළකෙන අයුරින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) ඇප සහිතව හෝ රහිතව ණයට ගැනීම හෝ රැස්කිරීම සහ මුදල් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම;

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලය වෙත ලබා දෙනු ලබන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කමිටුව විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීම සහ නිකුත් කිරීමට සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල්, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ඉඩකඩම් හෝ පෞද්ගලික දේපලකට බලපාන්නා වූ යම් නීතිමය භාරයක් හා කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කර වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම; සහ

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු දේ සිදුකිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**10.** (1) පදනමේ කටයුතු මේ පනතේ අනිකුත් විධිවිධාන සහ සංස්ථාවේ තත් කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු එකොළොස් දෙනෙකුගෙන් (11) සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් කළමනාරණය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ ආරම්භක සාමාජිකයා මෙන්ම වර්තමාන සභාපති වූ ඇම්. ලක්ෂ්මන් කුරේ මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ යාවජීව සභාපතිවරයා විය යුතු අතර, ඉන් අනතුරුව ධුරය දරන තැනැත්තාගේ පවුලේ සාමාජිකයකු අධ්‍යක්ෂ මණ්ඩලයේ ඊළඟ සභාපතිවරයා විය යුතු ය.

අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ගේ කාර්ය භාරය

**11.** අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ගේ කාර්ය භාරය-

(1) සභාපති:

(අ) සභාවේ මුලසුන දැරීම;

(ආ) පදනමේ සියලුම කටයුතු පරීක්ෂා කිරීම;

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ මහ සභා රැස්වීමට ඉදිරිපත් කිරීම;

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ මත සාමාජිකයන් ඉවත් කිරීම.

(2) ලේකම්:

(අ) වාර්ෂික මහා සභා රැස්වීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, පදනමේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තා පවත්වාගෙන යාම, පදනමේ ලියකියවිලි අත්සන් තැබීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තමන් වෙත පවරනු ලබන වෙනත් කාර්ය ඉටු කිරීම;

(ආ) සංස්ථාවේ සියලු ලිපි ලේඛන තමා භාරයේ පවත්වාගෙන යාම සහ ඒවා ආරක්ෂා කිරීම;

(ඇ) සෑම වසරකදීම දෙසැම්බර් මසට පෙර මහා සභා රැස්වීම කැඳවීම;

(3) භාණ්ඩාගාරික;

(අ) සංස්ථාවේ සියලු මුදල්වල ආරක්ෂාව භාරව හා අධ්‍යක්ෂ මණ්ඩලයේ විධාන පරිදි හා සභාපතිවරයාගේ අණ පරිදි වියපැහැදම් කිරීම;

(ආ) ලැබීම් සහ ගෙවීම් පිළිබඳ නිසි පොත්පත් ක්‍රමවත්ව පවත්වාගෙන යාම;

(ඇ) සංස්ථාවට අයත් සියලු උපකරණ හා දේපළ සම්බන්ධයෙන් අවශ්‍ය බඩු වට්ටෝරු සහ ලේඛන තබා ගැනීම;

(ඈ) සංස්ථාවේ සියලු මුදල් නිලධාරී මණ්ඩලය පිළිගත් බැංකුවක අනිවාර්යයෙන්ම තැන්පත් කිරීම සහ ඒවා අවශ්‍ය පරිදි පදනමේ කටයුතු සඳහා පරිහරණය කිරීම;

(ඉ) වාර්ෂික ගිණුමේ වාර්තාව විගණනය කර අවසානයේ අධ්‍යක්ෂ මණ්ඩලයට හා මහා සභාවට ඉදිරිපත් කිරීම.

**පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය**

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ පදනමට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

**විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ**

**13.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් සභාවේ යම් මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව**

**14.** (1) සංස්ථාපිත මණ්ඩලයේ සභාපති සහ තවත් සාමාජිකයන් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට

ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි මණ්ඩලයේ යම් ධුර දරන නිලධරයකු භාරයේ තිබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**15.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුලත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.